12698475
8490
8507
2693869
112692913
) postmaster@health.gov.lk
)
)
) www.health.gov.lk
)
)

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය
எனது இல
My No. 74/2010

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) 2012.05.16
Date )

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

පොදු චක්‍රලේඛ අංක:- 01 - 24 /2012

සෞඛ්‍ය අමාත්‍යාංශයේ සියළුම මාණ්ඩලික නිලධාරීන්,
ආයතන ප්‍රධානීන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන්,
දේශීය අමාත්‍යංශයේ සියළුම ආයතන ප්‍රධානීන් වෙත.

<u>සන්නිවේදන දීමනාව - වෛද්‍ය නිලධාරී</u>

වෛද්‍ය නිලධාරීන්ට ලබා දෙන සන්නිවේදන දීමනාව සඳහා සරල ක්‍රමවේදයක් මගින් ගෙවීමෙ කටයුතු ඉදිරියට සිදුකරනු ලැබේ. ඒ සඳහා පහත දැක්වෙන පිළිවෙල මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය මගින් අනුමත කර ඇත. තවද වෛද්‍ය නිලධාරීන් හට මෙම දීමනාව ගෙවනු ලබනුයේ අත්‍යාවශ්‍ය සහ හදිසි සේවා පවත්වාගෙන යාමේදී පහසුවක් වශයෙනුත් දැනුම යාවත් කිරීම යන කාරණාත් සැලකිල්ලට ගැනීමෙනි.

ඉහත කරුණ සම්බන්දයෙන් භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කර ඇති 2010-09-01 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 446 සහ මෙම දීමනාව ලබා දීම සරල කිරීම සඳහා භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කරන ලද 2012-05-11 දිනැති චක්‍රලේඛයෙන් ලබා දෙන නියෝග අනුව වෛද්‍යවරුන්ගේ ඉහත දීමනාව සම්බන්ධ අංක Health Ministry/CA/191 හා 2012-03-08 දිනැති චක්‍රලේඛයට වැඩිමනත් වශයෙනි.

1. වෛද්‍ය නිළධාරීන්ට හිමි දුරකතන දීමනාවෙන් උපරිම සීමාවෙන් 2/3ක මුදලක් කිසිදු බිල්පත් ඉදිරිපත් කිරීමකින් තොරව වැටුප සමගගෙවන දීමනාවක් ලෙස ගෙවිය යුතුය.

2. රාජකාරි දුරකථන හිමි වෛද්‍ය නිලධාරීන්ට මෙම දීමනාව මුළු දීමනාවෙන් 1/3 ක් වශයෙන් ගෙවනු ලැබේ.

3. 2012 මැයි මාසයේ සිට මේ තිරණය ක්‍රියාත්මක වේ.

4. ආදාල නිළධාරියා සිය බිල්පත් ඉදිරිපත් කර මුළු මුදල ලබා ගන්නේද නැති නම් බිල්පත් ඉදිරිපත් නොකර උපරිම සීමාවෙන් 2/3ක මුදලක් හිමි කර ගන්නේ ද යන බව දැනුම් දෙන අකෘති පත්‍රයක් මේ සමග අමුණා ඇති අතර ආදාල ආකෘති පත්‍රය සිය ආයතන ප්‍රධානියා වෙත ඉදිරිපත් කර ඔහුගේ අනුමැතිය සහිතව, එම අකෘති පත්‍රය අනුමැතියට <u>යොමුකල මාසයේ</u> සිට ගෙවීම සිදු කල යුතුය.

5. මෙම චක්‍රලේඛය මගින් බිල් ඉදිරිපත් කරමින් ඔවුන්ට ලබා ගත හැකිව තිබිය යුතු සීමාවන් කිසිවක් අවලංගු වී නැති බවත් මෙම නව ක්‍රමවේදය බිල් රහිතව කල හැකි සරල ක්‍රමවේදයක් බවත් සැලකිය යුතුය.

6. බිල් ඉදිරිපත් කර මෙම දීමනාව උපරිමය දක්වා ලබා ගැනීමට අපේක්ෂිත වෛද්‍ය නිලධාරීන්ට 2012.03.08 දිනැති මගේ චක්‍රලේඛන අංක: Health Ministry/CA/191 අනුව අදාල කටයුතු සම්පූර්ණ කර දීමනාව ලබාගත යුතුය.

වෛද්‍ය රවීන්ද්‍ර රුබේරු
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

වෛද්‍ය රවීන්ද්‍ර රුබේරු
සෞඛ්‍ය ලේකම්